## පුනරුත්ථාපන කාර්යාංශයේ තනතුරු සඳහා අයදුම් කරනු ලබන අයදුම්පත්‍රය සම්පූර්ණ කිරිමේදී හා අයදුම්පත් ගාස්තු ගෙවීමේදී අනුගමනය කල යුතු උපදෙස්

### අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර

**අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර කරුණාකර පහත උපදෙස් සලකා බලන්න.**

- අයදුම්පත බාගත කර (Download) සම්පූර්ණ කළ යුතුය.
- අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ඔබ විසින් අයදුම් කිරීමට බලාපොරොත්තු වන තනතුරට අදාළව, මෙහි දක්වා ඇති උපදෙස් හොඳින් කියවා තේරුම් ගැනීමෙන් අනතුරුව අයදුම්පත සම්පූර්ණ කරන්න.
- ඔබ විසින් තනතුරු කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම්, ඒ සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතුය.
- සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කිරීමට බැඳී සිටිය යුතුය.
- අයදුම්කරුවන් බඳවා ගැනීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් පුනරුත්ථාපන කාර්යාංශය සඳහා අනුමත කරන ලද බඳවා ගැනීම් පරිපාටියට අනුව සිදුකරනු ලැබේ.

### අයදුම්පත් සම්පූර්ණ කිරිමේදී

- අයදුම්පත් භාෂා ත්‍රිත්වයෙන්ම (සිංහල, ඉංග්‍රිසී, දෙමළ) බාගත (Download) කර ගත හැකි අතර ඔබට පහසු භාෂා මාධ්‍යයෙන් සම්පූර්ණ කල හැකිය.
- පළමුව ඔබ අභ්‍යන්තර අයදුම්කරුවෙක්ද/ බාහිර අයදුම්කරුවෙක්ද යන්න නිවැරදිව සඳහන් කල යුතුය
- මෙහිදී දැනට පුනරුත්ථාපන කාර්යාංශයේ අභ්‍යන්තර සේවකයන් පමණක් Internal Applicant යන්නට අයත් වේ.
- අනෙකුත් සියලුම අයදුම්කරුවන් බාහිර අයදුම්කරුවන් (External Applicant) වේ.
- දෙවනුව ඔබ විසින් බඳවාගැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යය නිවැරදිව තෝරන්න. (ඉල්ලුම් කළ හැක්කේ එක් භාෂා මාධ්‍යයක් පමණි.)
- තෙවනුව අයදුම්පත්‍රයේ ඉල්ලුම් කර ඇති සියළුම තොරතුරු නිවැරදිව සම්පූර්ණ කළ යුතුය.
- ඔබ අයදුම් කරන තනතුර නිවැරදිව සඳහන් කළ යුතුය.
- විභාග ප්‍රවේශ පත්‍රය / සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ ලිපි යොමු කරනු ලබන්නේ ඔබ විසින් සඳහන් කර ඇති අයදුම්පත්‍රයේ සමාංක 06 හි සඳහන් ලිපිනයට වේ. (සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේදී ලිපි එවිය යුතු ලිපිනය)

### අයදුම්පත් ගාස්තුව

- පුනරුත්ථාපන කාර්යාංශයේ අභ්‍යන්තර අයදුම්කරුවන් පමණක් අයදුම්පත් ගාස්තු නොගෙවිය යුතු අතර, අනෙකුත් සියලුම බාහිර අයදුම්කරුවන් රු. 500/- ක අයදුම්පත් ගාස්තු ගෙවීම අනිවාර්ය වේ.
- ඔබ තනතුරු කිහිපයකට අයදුම් කරන්නේ නම් අදාළ තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත් ගාස්තු ගෙවිය යුතුය.
- **"Bureau of Commissioner General of Rehabilitation"** නමින් පවත්වාගෙන යනු ලබන, ලංකා බැංකුවේ **Borella Super Grade Branch** ශාඛාවේ අංක **0007042763** දරණ ගිණුමට මුදල් බැර කිරීමෙන් (මාර්ගගත ක්‍රමයට හෝ CDMA මාර්ගයෙන් ද ඉහත සඳහන් කාර්යාංශයේ ගිණුමට ගෙවීම් සිදු කළ හැකිය), මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපතක් ඔබ ළඟ තබාගෙන එහි මුල් පිටපතෙහි (Deposit slip) ඉහළින්, නිල් පැහැති පැනක් පමණක් භාවිතා කර ඔබගේ නම සහ ඔබ අයදුම් කරන තනතුර පැහැදිලි අකුරින් සඳහන් කර අයදුම්පතට අමුණා එවිය යුතුය.
- අයදුම්පත් ගාස්තුව නැවත ගෙවනු නොලැබේ.

- අයදුම්පත්‍රයේ **"අයදුම්පත්‍ර ගාස්තු ගෙවීම් විස්තර"** පිළිබඳ පහත කොටස නිවැරදි සම්පූර්ණ කළ යුතුය.

    - Branch - මුදල් ගෙවන ලද බැංකු ශාඛාව
    - Bank Name - ඔබ විසින් මුදල් ගෙවන ලද බැංකුවේ නම
    - Payment date - ගෙවීම් කළ දිනය
    - Account Number - මාර්ගගත ක්‍රමයට මුදල් ගෙවන ලද්දේ නම් එම ගිණුම් අංකය (CDMA හෝ බැංකුවට ගෙවන ලද්දේ නම් එම අංකය)
    - Transaction ID / Reference No (if applicable) - මාර්ගගත ක්‍රමයට හෝ බැංකුවට මුදල් ගෙවන ලද්දේ නම් එහි මුද්‍රිත අංකය ද, CDMA මඟින් මුදල් ගෙවන ලද්දේ නම් එහි මුද්‍රිත අංකය ද සඳහන් කරන්න.

## <u>අයදුම්පත සම්පූර්ණ කළ පසු</u>

- අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් අනතුරුව **අයදුම්පත් ගාස්තු ගෙවූ රිසිට්පතේ මුල් පිටපත අමුණා ඉල්ලුම් කරනු ලබන සහතිකපත් සමඟ ලියාපදිංචි තැපෑලෙන් යොමු කල** යුතුය.

## <u>දෘඩ පිටපත සහ අදාළ ලේඛන ඉදිරිපත් කිරීම</u>

- රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානීගේ අනුමැතිය සහිතව අයදුම්පත් යොමු කළ යුතුය.
- පුරප්පාඩු තනතුරු සඳහා අයදුම්කරනු ලබන අයවළුන් විසින් බාගත කර සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමඟ පහත දක්වා ඇති සහතිකපත්හි සහතික කරන ලද ඡායාස්ථ පිටපත් ඉදිරිපත් කළ යුතු වේ.

    (අ) උප්පැන්න සහතිකය
    (ආ) අධ්‍යාපන සහතික
    (ඇ) ජාතික හැදුනුම්පත
    (ඈ) ග්‍රාම සේවා සහතිකය (ප්‍රමාදයන් පවතින්නේ නම් මෙම සහතිකය රහිතව අයදුම් කරන්න.)
    (ඉ) මාස 03 ක් ඇතුලත ලබා ගත් චරිත සහතික 02ක්
    (ඊ) ක්‍රීඩා සහ අනෙකුත් කුසලතාවලට අදාළ සහතිකපත්
    (උ) තනතුරට අදාළ යැයි හැඟෙන වෙනත් සහතිකපත්

- අයදුම්පත්‍රයේ ඔබ විසින් සපයා ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට ප්‍රකාශ කර, කිසියම් අසත්‍ය තොරතුරක් පසුව අනාවරණය වුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හෝ රැකියාව අවසන් කිරීමට හේතු විය හැකි බවට තේරුම් ගත් බව ඔබ විසින් අත්සන් යොදා සහතික කළ යුතුය.
- අයදුම් කරන ලද තනතුර ලියුම් කවරයේ **වම් පස ඉහළ කෙළවරේ** පැහැදිලිව සඳහන් කර, අදාළ සහතිකවල පිටපත් සහ බාගත කරන ලද අයදුම්පත සමඟ ලියාපදිංචි තැපෑලෙන් **"පුනරුත්ථාපන කාර්යාංශය, අංක: 462/2, කඩුවෙල පාර, ගණහේන, බත්තරමුල්ල"** යන ලිපිනයට අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර යොමු කළ යුතුය.
- ඉහත උපදෙස් පරිදි අයදුම්පත ලබාගැනීම සඳහා CLICK HERE භාවිතා කරන්න.

## <u>අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම</u>

- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් / අසම්පූර්ණ අයදුම්පත් / මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපත අමුණා නොමැති අයදුම්පත් / බාගත කරන ලද (Download) අයදුම්පත හැර ඉදිරිපත් කරන ලද වෙනත් අයදුම්පත් / අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් / අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසු ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. කිසියම් හේතුවක් මත අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ නැවත සලකා බලනු නොලැබේ.
- පුනරුත්ථාපන කාර්යාංශයේ තීරණය අවසාන තීරණය වේ.
- අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන ...................... වන දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## <u>පොදු කරුණු</u>

- අභ්‍යන්තර පරීක්ෂණ මණ්ඩලයක් මඟින් මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව තෝරා ගනු ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
- වැඩි විස්තර සඳහා කරුණාකර **0112883891** අමතන්න.